# ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

# ආචාර ධර්ම සංග්‍රහය

# ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාව තුළ ක්‍රීඩාව ආරම්භ වන්නේ විනෝදයට අමතරව විනය, පුහුණුව, සහභාගීත්වය යන කරුණු තුන මුල්කර ගෙනය. මෙතුළින් ශාරීරික වර්ධනය, ශක්ති වර්ධනය පමණක් නොව මිනිසාගේ මානසික වර්ධනය ද ඉහළ නංවාලිය හැකිය.

විදේශීය බලපෑම් හේතුවෙන් දේශීයව පැවති ඉපැරණි, සාම්ප්‍රදායික ක්‍රීඩාවන් කෙමෙන් කෙමෙන් ජනයාගෙන් ඈත් වන්නට වූ අතර විවිධ රටවල ක්‍රීඩා තරග මෙරට ප්‍රචලිත විය. එම ජාත්‍යන්තර තරග සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට 1937 දී පමණ ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටුව හා පොදු රාජ්‍ය මණ්ඩලීය සංගමය ආරම්භ විය.

ග්‍රාමීය තරුණ තරුණියන් තුළ ක්‍රීඩාව සහ පොදු විනෝදත්වය පිළිබඳ සීඝ්‍ර වර්ධනයක් ආරම්භ වීමත් සමඟ ක්‍රීඩාවෙහි විප්ලවීය වෙනසක් මෙරට ඇතිවන්නට විය. ඊට හේතුව වූයේ 1965 වර්ෂයේ නව ජනරජය පත්වීමත් සමඟ නවතම අමාත්‍යාශයක් ලෙස ක්‍රීඩා අමාත්‍යාංශය ආරම්භ විය. ඉන්පසු 1966 වර්ෂයේ දී එවකට ජනසතු සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රීඩා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී.

1960 දශකයේ දී කුඩා ඒකකයක් ලෙස ආරම්භ කරන ලද ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව 1970 දී අරඹන ලද පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතට ගෙන 1996 දී ඒ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් බවට උසස් විය.

නිරෝගිමත් ක්‍රියාශීලී සමාජයක් උදෙසා ක්‍රීඩා සංස්කෘතියක් සහ විනයගරුක බව තුළින් ක්‍රීඩාවේ විශිෂ්ඨයන් බිහි කරමින් ක්‍රීඩාවේ උන්නතිය සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරන ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව අද වන විට ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

- **දැක්ම**

  "ජාතික අභිමානය උදෙසා ජවසම්පන්න ශ්‍රී ලාංකිකයෙක්."

- **මෙහෙවර**

  සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක්, තරගකාරී ක්‍රීඩාවන්හි ජයග්‍රාහී මානසිකත්වයක් නිර්මාණය, සමෘද්ධිමත් ක්‍රීඩා සංස්කෘතියක් ඇති කිරීම තුළින් ක්‍රීඩාවේ විශිෂ්ඨත්වය ළඟා කර ගැනීම.

- **අරමුණු**

  1. සමාජයේ සියලුම අංශවලට ක්‍රීඩාවට අවකාශය ලබාදීම තුළින් ශාරීරික සුවතාවය, ඵලදායීතාවය හා තෘප්තිය වර්ධනය කිරීම.
  2. ක්‍රීඩා ක්ෂේත්‍රය තුළින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ජයප්‍රභණ අත්කර ගැනීම.
  3. ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර තලයට ගෙන යා හැකි අන්තර්ජාතික මට්ටමේ දැනුමැති දේශීය පුහුණුකරුවන් බිහි කිරීම.
  4. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතියෙන් යුත් ක්‍රීඩා පහසුකම් ලබා දීම.

# පටුන


ආචාර ධර්ම සංග්‍රහය ........ 4

1. අරමුණ ........ 4
2. ආචාර ධර්ම විෂය පථය ........ 4
3. නීතිමය බලය ........ 5
4. මූලික මාර්ගෝපදේශ ........ 5
5. රාජ්‍ය නිලධාරියෙකු වශයෙන් පිළිපැදිය යුතු පොදු නීති ........ 6
6. මහජනතාව සමඟ සම්බන්ධතා ........ 7
7. අභිලාෂයන් අතර ගැටුම ........ 7
8. සමානාත්මතාව, ශික්ෂණය හා හිරිහැර වැළැක්වීම ........ 7
9. මූල්‍ය අඛණ්ඩතාවය ........ 7
10. රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම ........ 8
11. දේශපාලන මධ්‍යස්ථභාවය ........ 8
12. රහස්‍යතාව හා තොරතුරු කළමනාකරණය ........ 8
13. තෑගි, ප්‍රදාන සහ සංග්‍රහයන් පිළිගැනීමේ සීමා ........ 8
14. ක්‍රීඩක ආරක්ෂාව හා වගකීම් ........ 8
15. වැඩ පරිසරය ........ 9
16. තහනම් හැසිරීම ........ 9
17. විනය ක්‍රියාපටිපාටි ........ 9
18. ක්‍රියාත්මක කිරීම හා අනුකූලතාව ........ 9
19. සමාලෝචනය හා සංශෝධනය ........ 9

සත්‍යාපන ප්‍රකාශනය ........ 10

# ආචාර ධර්ම සංග්‍රහය

මෙම ආචාර ධර්ම සංග්‍රහය, ජාතික ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ නීතිමය, වෘත්තීයමය හා ආචාරධර්මීය ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා බැඳී පවතින පරිපාලන ලේඛනයක් ලෙස නිකුත් කරන අතර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රීඩා පරිපාලනය, කළමනාකරණය සහ සහභාගීත්වයට සම්බන්ධ සියලුම පුද්ගලයින්ට අදාළ වන ආචාර ධර්ම මූලධර්ම, හැසිරීම් ප්‍රමිතීන් සහ විනය රාමුව දක්වා ඇත.

## 1. අරමුණ

මෙහි අරමුණ වන්නේ,

- ක්‍රීඩාවල අඛණ්ඩතාව, විනිවිදභාවය, වගවීම සහ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම.
- ක්‍රීඩා පරිපාලනය තුළ ආචාරධර්මීය හා වෘත්තීය හැසිරීම ප්‍රවර්ධනය කිරීම.
- ක්‍රීඩකයින්ගේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ අයිතිවාසිකම්, සුබසාධනය හා ගෞරවය ආරක්ෂා කිරීම.
- දූෂණ, අපයෝජන හා රාජ්‍ය සම්පත් අනිසි භාවිතය වැළැක්වීම.
- ක්‍රීඩා පරිපාලනය පිළිබඳ මහජන විශ්වාසය ශක්තිමත් කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩාවල ශ්‍රී ලංකාවේ කීර්ති නාමය ආරක්ෂා කිරීම.

## 2. ආචාර ධර්ම විෂය පථය

මෙම සංග්‍රහය පහත සඳහන් සියලු පුද්ගලයින්ට අදාල වේ:

- ස්ථිර, තාවකාලික හෝ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරීන් හා සේවකයින්
- ක්‍රීඩා පනත යටතේ පත්කරන ජාතික ක්‍රීඩා සභා, කමිටු, මණ්ඩල හා අධිකාරීන්ගේ සාමාජිකයින්
- පුහුණුකරුවන්, තේරීම්කරුවන්, විනිසුරුවන්, තාක්ෂණික නිලධාරීන් හා සහායක කාර්ය මණ්ඩලය
- උපදේශකයින්, ස්වේච්ඡා සේවකයින් හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරන ඕනෑම පුද්ගලයෙකු

## 3. නීතිමය බලය

මෙම ආචාර ධර්ම සංග්‍රහය පහත සඳහන් නීති හා නියෝගයන්ට අනුකූලව නිකුත් කරනු ලැබේ:

- ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- ක්‍රීඩා පනත, අංක 25 දරන 1973 සහ එහි සංශෝධන
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
- දූෂණ විරෝධී පනත
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, මුදල් චක්‍රලේඛ, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපටිපාටික රීති සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන සියලුම චක්‍රලේඛ, නියෝග හා උපදෙස්
- තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන අභ්‍යන්තර චක්‍රෙල්ඛ

මෙම සංග්‍රහයට අනුකූල වීම අනිවාර්ය වන අතර ක්‍රියාත්මක කළ හැකි වේ.

## 4. මූලික මාර්ගෝපදේශ

මෙම සංග්‍රහයට යටත් සියලු පුද්ගලයින් පහත මූලධර්මයන් අනුගමනය කළ යුතුය.

- අඛණ්ඩතාව
  - සැම විටම අවංකව, සදාචාරාත්මකව සහ යහපත් විශ්වාසයකින් කටයුතු කිරීම.
- සාධාරණත්වය සහ සමානාත්මතාවය
  - ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය හෝ සමාජ තත්ත්වය මත පදනම්ව වෙනස්කම් කිරීමකින් තොරව සමාන සැලකීම සහතික කිරීම.
- විනිවිදභාවය සහ වගවීම
  - සියලුම මූල්‍ය, පරිපාලන සහ තේරීම් ක්‍රියාවලීන් විනිවිදභාවයෙන් හා වගකීමෙන් යුතුව සිදු කිරීම.
- ගෞරවය සහ ක්‍රීඩාශීලිත්වය
  - ක්‍රීඩකයන්, නිලධාරීන්, ප්‍රේක්ෂකයින් සහ මහජනතාව කෙරෙහි ගෞරවය දැක්වීම.
- ජාතික වගකීම
  - ශ්‍රී ලංකාවේ ගෞරවය සහ කීර්ති නාමය ආරක්ෂා කර රටට අපකීර්තියක් ගෙන දෙන ඕනෑම හැසිරීමකින් වැළකීම.

## 5. රාජ්‍ය නිලධාරියෙකු වශයෙන් පිළිපැදිය යුතු පොදු නීති

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියලුම සේවකයින් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූල වීම සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳිය යුතුය. විශේෂයෙන්, කඩිනම් හා වගකීම් සහිතව තම රාජකාරි ඉටු කිරීම සඳහා අදාළ සියලු නීති, නියෝග, චක්‍රලේඛ හා පරිපාලන උපදෙස් අනුගමනය කළ යුතුය.

ඒ අනුව,

- සියලුම වැඩ කරන දිනවල කාර්යාලයට රජයේ නිලධාරීන්ගේ පැමිණීම පෙ.ව. 08.30 සිට ප.ව. 04.15 දක්වා විය යුතු අතර, රජයේ කාර්යාල සෑම වැඩ කරන දිනකම ප.ව. 03.00 දක්වා මුදල් ගනුදෙනු සඳහා විවෘතව තැබිය යුතුය.
- සෑම නිලධාරියෙකුම තම පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් තහවුරු කළ යුතුය.
- නිවාඩු ලබා ගැනීමේදී රාජකාරියට බාධාවක් නොවන පරිදි ලබා ගැනීම කළ යුතුය. හදිසි කාරණයක් හේතුවෙන් යම් නිලධාරියෙකු වැඩ කරන දිනයක රාජකාරියට නොපැමිණෙන්නේ නම්, ඔහුගේ/ ඇයගේ නොපැමිණීම පැය 24ක් ඇතුළත ආයතන ප්‍රධානියාට දැනුම් දිය යුතුය.
- රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරකට අලුතින් පත් කරන ලද රාජ්‍ය නිලධාරියෙකු පත්කිරීමේ බලධාරියා විසින් වසර 03 ක පරිවාස කාලයකට යටත් කරනු ලබන අතර, එම කාලය තුළ ඔහු තම පැමිණීම, හැසිරීම සහ කාර්යය ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීමෙන් රාජ්‍ය සේවයට සුදුසු පුද්ගලයෙකු බව සහතික කළ යුතුය.
- රාජ්‍ය නිලධාරියෙකු ඉල්ලා අස්වන අවස්ථාවක දී, දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා පත්කිරීමේ බලධාරියාට මාසයක දැන්වීමක් ඉදිරිපත් කිරීමෙන් හෝ ඒ වෙනුවට මාසයක වැටුපක් ගෙවීමෙන් ඔහුට තම තනතුරෙන් ඉල්ලා අස්විය හැකිය. කෙසේ වෙතත්, පත්කිරීමේ බලධාරියා නිලධාරියාගේ ඉල්ලා අස්වීම පිළිගැනීම ප්‍රතික්ෂේප කළහොත් නිලධාරියා රාජකාරියට වාර්තා කිරීම නතර කළහොත්, ඔහු එසේ සේවයට වාර්තා කිරීම නතර කළ දින සිට ඔහුගේ තනතුර හිස් වූ බව සලකනු ලැබේ.
- යම් නිලධාරියෙකුට කාර්යාල වේලාවන් තුළ කාර්යාලයෙන් පිටව යා හැක්කේ නිල කටයුත්තක් සඳහා පමණක් වන අතර ඒ සඳහා මාණ්ඩලික නිලධාරියෙකුගේ අවසරය ලබා ගත යුතුය.
- අතිකාල ගෙවීම් හා 1/30 ගෙවීම් සිදු කිරීමේ දී ඇඟිලි සලකුණු යන්ත්‍රයේ තම පැමිණීම හා පිටවීම අනිවාර්යෙන් සලකුණු වී තිබිය යුතුය.
- සෑම නිලධාරියෙකුම තමාට පවරා ඇති ඕනෑම රාජකාරියක් කාර්යක්ෂමව හා කඩිසරව ඉටු කළ යුතුය.
- නිලධාරියා අදාළ රාජකාරි උපදෙස් නිසි ලෙස තේරුම් ගෙන ඒවාට අනුකූල විය යුතුය.
- තම පෞද්ගලික වගකීම් සහ නිල රාජකාරි අතර කිසිදු ගැටුමක් ඇති නොවන පරිදි ක්‍රියා කළ යුතුය.
- සෑම නිලධාරියෙකුම රාජ්‍ය වත්කම් හා දේපළ ආරක්ෂාවන අයුරින් භාවිතා කිරීම හා අනිසි භාවිතයෙන් වැළකී සිටිය යුතුය.

- සෑම නිලධාරියෙකුම රාජකාරියේ යෙදී සිටියදී හෝ ඔහුගේ කාර්යාල පරිශ්‍රයේ හෝ වෙනත් කාර්යාල පරිශ්‍රයක රාජකාරියෙන් බැහැරව සිටියදී මත් වී හෝ විෂ සහිත මත්ද්‍රව්‍ය භාවිතා නොකළ යුතුය.
- සෑම නිලධාරියෙකුම, සේවා නිසි ලෙස ලබා ගැනීමට මහජනතාවට ඇති අයිතිය සහතික කළ යුතුය.

## 6. මහජනතාව සමඟ සම්බන්ධතා

සියලුම නිලධාරීන් ජාතිය, ආගම, ලිංගිකත්වය, වයස, දේශපාලන අදහස්, සමාජ තත්ත්වය හෝ ක්‍රීඩා පසුබැසීම නොසලකා ගෞරවයෙන්, සාධාරණයෙන්, ශිෂ්ටාචාරයෙන් හා පක්ෂපාතීත්වයකින් තොරව මහජනතාව සමඟ සම්බන්ධතා පැවැත්විය යුතුය. මහජනතාව සමඟ සිදු කරන සියලුම තීරණ, ක්‍රියාමාර්ග සහ සන්නිවේදන විවෘත විය යුතු අතර මහජන විමර්ශනයට යටත් විය හැකි ආකාරයෙන් ක්‍රියාත්මක කළ යුතුය. හිතාමතා අසත්‍ය, මඟහැරුණු හෝ වංචාකාරී තොරතුරු ලබාදීම තහනම් වේ. කිසිදු නිලධාරියකු තම නිල තත්ත්වය භාවිතා කර මහජනතාව, ක්‍රීඩකයන්, ක්‍රීඩා සංගම් හෝ පාර්ශවකරුවන් බිය ගැන්වීම හෝ අසාධාරණ ලෙස බලපෑම් කිරීම නොකළ යුතුය.

## 7. අභිලාෂයන් අතර ගැටුම

යම් නිලධාරියෙකුගේ නිල රාජකාරී කටයුතු පුද්ගලික, මූල්‍ය, වෘත්තීය, දේශපාලන හෝ පවුල් අභිලාෂයන් සමඟ සම්බන්ධ නොවී ස්වාධීනව හා අවංකව සිදුකළ යුතුය. කිසිම පුද්ගලයෙකු තම තනතුර පුද්ගලික, දේශපාලනික හෝ මූල්‍යමය වාසි සඳහා භාවිතා නොකළ යුතුය.

## 8. සමානාත්මතාව, ශික්ෂණය හා හිරිහැර වැළැක්වීම

ජාතිය, ජාතික හෝ වාර්ගික සම්භවය, ආගම, වයස, ලිංගික දිශානතිය, ආබාධිතභාවය හෝ සමාජ පසුබිම මත සලකා බලා භේදභාවය ඇති වන සේ තම රාජකාරි කටයුතු සිදු නොකළ යුතුය. වෙනත් ඕනෑම වෙනස් කොට සැලකීමේ ක්‍රියාවන්හි නිරත නොවිය යුතුය. ලිංගික හිරිහැර, බියගැන්වීම් හෝ අපයෝජනය කිසිසේත්ම පිළිගත නොහැකි අතර සියලු නිලධාරීන් තම විනය හා අන්‍යෝන්‍ය ගෞරවය පවත්වා ගත යුතුය.

## 9. මූල්‍ය අඛණ්ඩතාවය

රාජ්‍ය වත්කම් ආරක්ෂා කිරීම, මහජන විශ්වාසය සුරැකීම, සියලුම මූල්‍ය ක්‍රියාකාරකම් පාරදෘශ්‍ය, නීතිමය සහ දූෂණයෙන් තොර බවට සහතික කිරීම සඳහා මූල්‍ය විනිවිදභාවය පවත්වා ගෙන යෑම වැදගත් වේ. ක්‍රීඩාව සඳහා වෙන්වන අරමුදල්, වත්කම් සහ අනුග්‍රාහකත්වයන් බලයලත් අරමුණු සඳහා පමණක් භාවිතා කළ යුතු අතර වංචාව, අයථා පරිහරණය, අල්ලස් හෝ දූෂණය තහනම්ය. සියලු ගනුදෙනු සඳහා සහය ලේඛන තිබිය යුතු අතර තොරතුරු නිසි වේලාවට සහ නිවැරදිව වාර්තා කළ යුතුය.

## 10. රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම

ගොඩනැගිලි, උපකරණ, වාහන, යන්ත්‍රෝපකරණ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) පද්ධති, මුදල්, ලේඛන, වාර්තා සහ අනෙකුත් වත්කම් ඇතුළත් සියලු නිල දේපල අදාළ නීති, නියෝග සහ පරිපාලන උපදෙස් අනුව අනුමත නිල කාර්යයන් සඳහා පමණක් භාවිතා කළ යුතුය. රජයේ දේපළ පුද්ගලික, දේශපාලන, වාණිජ හෝ අනුමත නොවූ කාර්යයන් සඳහා භාවිතා කිරීම, අන් අයට ණය දීම, පවරා දීම, හානි කිරීම, වෙනස් කිරීම හෝ නිසි අනුමැතියකින් තොරව ඉවත් කිරීම දැඩිව තහනම් වේ.

## 11. දේශපාලන මධ්‍යස්ථභාවය

තම පෞද්ගලික දේශපාලන මතය කුමක් වුවත් නිල කාර්යයන් ඉටු කිරීමේදී පවතින රජයේ ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දිය යුතුය. දෙපාර්තමේන්තුවේ සම්පත් දේශපාලන කටයුතු සඳහා භාවිත නොකළ යුතු අතර දේශපාලන ප්‍රවර්ධනය හෝ බලපෑම සඳහා ක්‍රීඩාව භාවිතා නොකළ යුතුය.

## 12. රහස්‍යතාව හා තොරතුරු කළමනාකරණය

නිල තොරතුරු අනුමත අරමුණු සඳහා පමණක් භාවිත කළ යුතුය. රහස්‍ය හෝ සංවේදී තොරතුරු නීතිමය අධිකාරියකින් තොරව හෙළි නොකළ යුතු අතර පුද්ගලික දත්ත අදාළ නීති අනුව ආරක්ෂා කිරීමට සියලුම නිලධාරීන් බැඳී සිටිය යුතුය.

## 13. තෑගි, ප්‍රදාන සහ සංග්‍රහයන් පිළිගැනීමේ සීමා

කිසිදු පුද්ගලයකුගෙන්, සංවිධානයකින්, සැපයුම්කරුවෙකුගෙන්, අනුග්‍රාහකයෙකුගෙන් හෝ වෙනත් පාර්ශවයකින් තම ස්වාධීනත්වය හෝ සදාචාරය අඩාල වන හෝ එසේ පෙනෙන තෑගි, ප්‍රදාන, ආගන්තුකත්ව හෝ වට්ටම් ඉල්ලා ගැනීම, පිළිගැනීම හෝ තබා ගැනීම නොකළ යුතුය.

## 14. ක්‍රීඩක ආරක්ෂාව හා වගකීම්

ක්‍රීඩකයින්ගේ ආරක්ෂාව, ශාරීරික හා මානසික සුවය සහ ඔවුන්ගේ ගෞරවය පවත්වා ගෙන යෑම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යයක් වේ. ඔවුන්ගේ ආරක්ෂණ ගැටළු වහාම අදාළ අධිකාරීන් වෙත වාර්තා කළ යුතුය.

- සාධාරණ ලෙස තරඟ පැවැත්විය යුතු අතර ක්‍රීඩාවේ නීතිරීතිවලට ගරු කළ යුතුය.
- මත්ද්‍රව්‍ය භාවිතය, තරඟ පාවාදීම, සූදුව හෝ ප්‍රතිඵල හැසිරවීමෙන් වැළකී සිටිය යුතුය.
- කණ්ඩායම් විනය පවත්වාගත යුතු අතර නිලධාරීන්ගේ නීත්‍යානුකූල උපදෙස් අනුගමනය කළ යුතුය.

## 15.වැඩ පරිසරය

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරීන් තම රාජකාරි ස්ථානවල නිර්මාණාත්මක, සාමකාමී සහ සෞඛ්‍ය සම්පන්න වැඩ පරිසරයක් රැකගැනීමේ වගකීම භාර ගත යුතුය. එකිනෙකා අතර ගරුත්වය, සාධාරණත්වය රැකෙන පරිදි හැසිරිය යුතුය. අසාධාරණ තර්ජන, උද්වේගජනක හැසිරීම්, වංචාකාරී හැසිරීම් හෝ වෙනත් වැරදි ක්‍රියාවලින් වැළකිය යුතුය. සියලුම නිලධාරීන් සහ සේවකයින් ආරක්ෂිත, අනතුරු රහිත හා සෞඛ්‍ය සම්පන්න කාර්ය පරිසරයකට සහභාගී විය යුතු අතර, කාර්ය සාධන සඳහා අවශ්‍ය පහසුකම් සහ ආරක්ෂණය සලසා දිය යුතුය.

## 16. තහනම් හැසිරීම

පහත සඳහන් දේ විෂමාචාරයට අයත් වේ.

- දූෂණය, අල්ලස් හෝ මූල්‍යමය දුෂ්කරතා
- පෞද්ගලික අවශ්‍යතා මත තරඟ පාවාදීම, ඔට්ටු ඇල්ලීම හෝ තරඟ හැසිරවීම.
- අපයෝජනය, හිරිහැර කිරීම හෝ බිය ගැන්වීම (ශාරීරික, වාචික, ලිංගික හෝ මානසික).
- ශ්‍රී ලංකාවට අපකීර්තියක් ගෙන දෙන නොසැලකිල්ල හෝ අගෞරවනීය හැසිරීම.
- රහස්‍යභාවය උල්ලංඝනය කිරීම හෝ නිල තොරතුරු අනිසි ලෙස භාවිතා කිරීම.
- දෙපාර්තමේන්තුවේ නීත්‍යානුකූල උපදෙස්වලට අනුකූල නොවීම.

## 17. විනය ක්‍රියාපටිපාටි

මෙම සංග්‍රහය උල්ලංඝනය කිරීම වරදක් ලෙස සැලකේ. යම්කිසි උල්ලංඝනය කිරීමක්, අක්‍රමිකතාවයක් හෝ ඕනෑම චෝදනාවක් ස්ථාපිත පරිපාලන මාර්ග ඔස්සේ වාර්තා කළ යුතුය. සියලුම පැමිණිලි රහසිගතව සහ සාධාරණව හැසිරවිය යුතුය. විනයාත්මක ක්‍රියාමාර්ග ආයතන සංග්‍රහය, ක්‍රීඩා පනත හා අදාළ නීති අනුව සිදුකළ යුතුය.

## 18. ක්‍රියාත්මක කිරීම හා අනුකූලතාව

මෙම ආචාරධර්ම සංග්‍රහයට යටත් සියලු නිලධාරීන් එහි විධිවිධාන අනුගමනය කළ යුතුය. ආයතන ප්‍රධානියා වන ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්තුමන්ගේ අනුමැතිය ලැබූ දින සිට ක්‍රියාත්මක වන අතර මෙය ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. මේ පිළිබඳව දැනුවත් කිරීමට, ආචාරධර්ම හා විනය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්විය යුතුය.

## 19. සමාලෝචනය හා සංශෝධනය

අදාළ නීති හා අනුමැතියන්ට යටත්ව මෙම සංග්‍රහය අවශ්‍ය විට සමාලෝචනය කර සංශෝධනය කළ හැක.

**සත්‍යාපන ප්‍රකාශනය**

සේවකයාගේ නම : ........................................................................................

තනතුර : ........................................................................................

අංශය : ........................................................................................

සේවක හැඳුනුම් අංකය : ........................................................................................

සේවා ආරම්භ දිනය : ........................................................................................

මම, පහතින් අත්සන් කරන නිලධාරියා ලෙස;

I. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආචාරධර්ම සංග්‍රහය කියවා, අවබෝධ කරගතිමි.
II. ආචාරධර්ම සංග්‍රහයේ සියලු නියම, උපදෙස් සහ සදාචාර මාර්ගෝපදේශයන් පිළිපැදීමට එකඟ වෙමි.
III. ආචාරධර්ම සංග්‍රහයට අනුකූල නොවීම විනයමය, පරිපාලන, සිවිල් හෝ අපරාධමය ක්‍රියාමාර්ගයට ලක් විය හැකි බව අවබෝධ කර ගතිමි.
IV. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ, මහජනතාවගේ හා ක්‍රීඩාවේ අභිවෘද්ධිය උදෙසා අවංකව, පක්ෂපාතීත්වයකින් තොරව, වගකීම් සහිතව රාජකාරි ඉටු කිරීමට වගකීම භාර ගනිමි.

නම : ........................................................................................

තනතුර : ........................................................................................

අත්සන : ........................................................................................

දිනය : ........................................................................................

.............................................. ..............................................

අංශ ප්‍රධානී අත්සන හා නිල මුද්‍රාව අධ්‍යක්ෂ ජනරාල් අත්සන හා නිල මුද්‍රාව